සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා උඌණ උපයෝජන
රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும்
கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DSD/HO//MF/BR/05 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | දිනය<br>திகதி<br>Date 2020.12.27 |

සියළුම සමෘද්ධි ප්‍රජා මූල බැංකු කළමනාකරුවන් හා
සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරුවන් වෙත.

**<u>2021 වසර සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල ලියාපදිංචිය අළුත් කිරීම, වාර්ෂික මහ සභා පැවත්වීම හා නිලවරණ පැවත්වීමේ කටයුතු පිළිබඳ.</u>**

වාර්ෂිකව සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවල ලියාපදිංචිය අළුත් කිරීම සම්බන්ධව උපදෙස් ලබාදුන් ඉහත සමාංක දරණ 2019.10.11 දිනැති ලිපිය හා බැඳේ. එම ලිපිය මගින් 2020 වර්ෂයට අදාලව සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ලියාපදිංචිය අළුත් කිරීමට අදාල උපදෙස් ලබාදී ඇත.

02. 2017 මාර්තු මස 07 දින නිකුත් කල 2009/08 අංක දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියෝග ප්‍රකාරව සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සෑම වසරකම මාර්තු 31 දිනට යටත් පිරිසයින් දින 30 කට ප්‍රථම (නියෝග අංක 5(6) යටතේ) ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ලියාපදිංචිය අළුත් කළ යුතුය.

03. ඒ අනුව, ඔබ විසින් 2021 වර්ෂය සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකුව/ බැංකු සමිතිය ලියාපදිංචිය අළුත් කිරීම සඳහා වන අයදුම්පත් 2021 පෙබරවාරි මස 10 දිනට පෙර යොමු කල යුතුවේ. <u>මෙම ලියාපදිංචිය අළුත් කිරීමේ කටයුතු සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වලට අදාල නියෝග ප්‍රකාරව සිදුවිය යුතු නීතිමය කටයුත්තක් බැවින්, අදාල අයදුම් පත්‍ර නිවැරදිව නියමිත දිනට යොමු කිරීමට වග බලා ගත යුතුය.</u>

04. පසුගිය වසරේ මෙන් සමෘද්ධි බැංකු හා බැංකු සමිති ලියාපදිංචියට අදාල මුදල (රු.1000/-) සමෘද්ධි බැංකු සමිතිය මඟින් රැස්කර එක් චෙක්පතක් මගින්, "කළමනාකරු ලංකා බැංකුව, බත්තරමුල්ල සමෘද්ධි ප්‍රජාමූල බැංකු අංශයේ ආයෝජන ගිණුම" ජංගම ගිණුම් අංක 3417925 ට බැර වනසේ ලියා දින 60 කට වලංගු වන පරිදි සටහන් තබා ලියාපදිංචි අයදුම් පත් සමඟයොමු කළ යුතු වේ.

05. ලියාපදිංචිය අළුත් කිරීමට අදාල අයදුම් පත්‍රය, ප්‍රජාමූල සංවිධාන තොරතුරු, මහ සභා හා පාලක මණ්ඩල තොරතුරු, මූල්‍ය තත්ත්ව විස්තර හා අදායම් ප්‍රකාශ තොරතුරු වල ආකෘති පත්‍ර පසුගිය වසරේ ආකෘති පරිදිම වන අතර, ප්‍රජාමූල සංවිධාන තොරතුරු නැවත ඉදිරිපත් කිරීමේදී සංශෝධිත තොරතුරු පමණක් යොමු කිරීම ප්‍රමාණවත්වේ.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி)<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

06. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතියට පාලක මණ්ඩලය හා විධායක කමිටුව පත්කිරීමේ උපදෙස් අංක ස/ප්‍ර/බැ/2017/06 හා 2017.03.17 දිනැති චක්‍රලේඛයේ උපදෙස් පරිදි වේ.

07. කෝවිඩ් 19 වසංගත තත්වය මත සෞඛ්‍ය අවධානමක් පවතින ප්‍රදේශවල සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති නිලවරණ හා මහ සභා පැවත්වීමේ කටයුතු නිසි පරිදි පැවත්වීමේ දුෂ්කරතාවයක් පවතින බැවින්, අදාල සෞඛ්‍ය අවධානම පහව යනතුරු, දැනට සිටින පාලක මණ්ඩල හා විධායක කමිටු නිලධාරීන් මගින් අදාල කටයුතු සිදුකල හැක.

වාර්ෂික මහ සභා හා නිලවරණ පැවත්විය හැකි කොට්ඨාශ වල සෞඛ්‍ය උපදෙස් අනුව සුපුරුදු පරිදි අදාල රැස්වීම් පවත්වා නව නිලධාරී මණ්ඩලයක් පත්කර ගත යුතුවේ. මෙම වාර්ෂික මහ සභා පැවැත්වීමේදී එක් අයෙකුට උපරිම රු. 300/- කට යටත්ව සංග්‍රහ වියදම් හා අනෙකුත් වියදම් දැරිය හැකිවේ.

08. ඉහත උපදෙස් අනුගමනය කරමින්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වල 2021 වසරට අදාල ලියාපදිංචිය අළුත් කිරීමේ අයදුම් පත්‍ර යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

09. මෙම ලියාපදිංචි කටයුතු පිළිබඳව යම් පැහැදිළි කර ගැනීමක් අවශ්‍යවේ නම් දුරකථන අංක 011-2887469 අමතන ලෙසද වැඩිදුරටත් කාරුණිකව සඳහන් කරමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-

01. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
02. දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ගැ.ස.
03. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ගැ.ස.
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස
05. අධ්‍යක්ෂවරුන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස.
06. ප්‍රාදේශීය ලේකම්වරුන්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - දැ.ගැ.ස.
07. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ගැ.ස හා අ.ක.ස.
08. නීති නිලධාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස හා අ.ක.ස
09. ගරු සභාපති, සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහ සංගමය. - කා.දැ.ගැ.ස